අපි මැතිවරණ 44ක් නිරීක්ෂණය කළා හැමෝම තමන්ගේ වාසිය බලනවා

- පැෆරල් විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි

මනම්පිටිය - නිමල් ජයරත්න

පසුගිය ආණ්ඩුව පළාත් පාලන මැතිවරණය කොටස් වශයෙන් පැවැත්වූවා. මේ ආණ්ඩුවට පළාත් මැතිවරණය පවත්වන්න උවමනාවක් නැහැ. මේ හේතුවෙන් කුඩා කුඩා පක්ෂ නැගී සිටින්නට පටන්ගෙන තිබෙනවා. යැයි පැෆරල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා කීවේය.

පිරිසිදු දේශපාලනයක් සඳහා මාර්තු 12 ව්‍යාපාරය පිළිබඳව පොළොන්නරුව දිස්ත්‍රික්කයේ රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන ප්‍රධානීන් සිවිල් සංවිධාන, මාධ්‍යවේදීන්, දැනුවත් කිරීමේ අවස්ථාවට එක්වෙමින් හෙට්ටිආරච්චි මහතා ඒ බව පැවැසීය.

පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලීය ශ්‍රවණාගාරයේදී එම දැනුවත් කිරීම සිදුවිය.

එහිදී වැඩිදුරටත් කතා කළ පැෆරල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා මෙසේද කීය.

'පැෆරල් සංවිධානය අවුරුදු 30ක් තුළ මැතිවරණ 44ක් නිරීක්ෂණය කළා. හැම රජයක්ම මැතිවරණ තිබ්බේ තමන්ට හිතෙන වෙලාවට. මේ රටේ පක්ෂ විපක්ෂ දේශපාලකයන්ට මෙනතත් පොදු චෝදනාවක් තියෙනවා.

ළමා අපචාර, ස්ත්‍රී දූෂණ, වංචා, අල්ලස් චෝදනා, මේවාට ගොඩක් දේශපාලකයන් ගැවිලා තියෙනවා. අපි ඒ බව පුවත්පත් දෙකක් තුළින් මාස තුනක් අධීක්ෂණය කරලා හොයා ගත්තා. මේ මාර්තු 12 ව්‍යාපාරයේ අරමුණ මැතිවරණයේදී පිරිසිදු අපේක්ෂකයෙකු තම පක්ෂයට පත්කර ගැනීමට කරන ක්‍රියාවලියක්. අද රාජ්‍ය ආයතන පිරිහිලා. ආගමික සංස්ථාව බිඳවැටිලා. සිවිල් සංවිධාන කෙරෙහි ජනතාවගේ පැහැදීම අඩු වෙලා. දේශපාලන සංස්කෘතිය කඩා වැටිලා. අනිත් හැම ආයතනයකට, ජනතාවකට දේශපාලන සංස්කෘතිය කඩා වැටුණොත් බලපානවා. රටේ දේශපාලකයෙක් තීරණයක් ගත්තොත් ඒක මුළු රටටත්, අනාගතයටත් බලපානවා. ඒ නිසා පාර්ලිමේන්තුවට, පළාත් සභාවට, ප්‍රාදේශීය සභාවට මන්ත්‍රීවරුන් තෝරා ගැනීමේදී වංචා දූෂණ නැති පිරිසිදු පුද්ගලයන් තෝරා පත්කර ගත යුතුයි. අද අපි අත්විඳින්නේ එදා දේශපාලනඥයන් කරපු වැරදි නිසා, තීරණ නිසා. දේශපාලනය කරන හැමෝකෙනාටම වැරදි නැහැ. නමුත් බහුතරයක් මේ රටේ දේශපාලකයන් කුමක් හෝ වැරදි කරන, වංචාවට, දූෂණයට අනුබල තියෙන අය. සමහර දේශපාලකයන් කොන්ත්‍රාත්කරුවන් බවට පත්වෙලා. "අද දේශපාලකයෙකුගේ උදව්වක්, ලිපියක් නැතිව මොකක්වත් කරගන්න බැරි තරමට අපි පත්වෙලා. ඒක හොඳ තත්ත්වයක් නොවෙයි.

අසරණ රෝගීන් වෛද්‍යවරයා අතින් දූෂණය වන තරමට මේ රට පත්වෙලා. එදා අපි ගුරුවරු දෙවිවරු ලෙස සැලකුවා. නමුත් අද සිසුන්ට තියෙන ගෞරවය බිඳවැටිලා. සමාජයේ හර පද්ධතීන් සීඝ්‍රයෙන් විනාශ වෙනවා. අපි මාර්තු 12 ව්‍යාපාරයෙන් උත්සහ දරන්නේ මේ රට පාලනය කරන්න. නීතිරීති හදන්න දේශපාලනයට එන අපේක්ෂකයන් වංචා, දූෂණ, නැති පිරිසිදු අයයෙකු පත්කරවන්නයි. ඒ සඳහා රට පුරා අපි රට පෙරහරක් ගිහින් අත්සන් දශලක්ෂයක් ලබාගෙන ඒ ඒ පක්ෂ නායකයන්ට ලබා දෙනවා. අපේක්ෂකයන්ට නාමයෝජනා ලබාදීමේදී දේශපාලන පක්ෂ සලකා බැලීමට එක්වූ පොදු නිර්ණායක අටකට අත්සන් කළා. ඒක ක්‍රියාත්මක කරන්න තමයි අපි මේ අත්සන් ගන්නේ.

මෙම අවස්ථාවට පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් රංජිත් ආරියරත්න, ආගමික නියෝජිතයන්, රාජ්‍ය අංශ ප්‍රධානීන්, සිවිල් සංවිධාන නියෝජිතයන්, මාධ්‍යවේදීන් ඇතුළු විශාල පිරිසක් එක්ව සිටියහ.

රෝහණ හෙට්ටිආරච්චි මහතා පැමිණි විද්වතුන් දැනුවත් කරමින්